# කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය සේවා ගණයට අයත් තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

**01 සම්බන්ධ වන ආයතන**

| | | | | |
|---|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | යොමු අංකය : DTET/04/AO/SOR/PL | දිනය : 2013.03.06 |
| 1.2 | අමාත්‍යාංශය : යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | යොමු අංකය : 2/1/17/2/13 | දිනය : 2013.03.14 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | යොමු අංකය : DMS/C/5/46 | දිනය : 2012.08.27 |
| 1.4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | යොමු අංකය : EST-2/RECRU/03/2048 | දිනය : 2013.01.30 |
| 1.5 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය : NSCC/1/44/1/SR | දිනය : 2012.12.24, 2013.01.28 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | යොමු අංකය : PSC/EST/8/1/44/1/4/2013 | දිනය : 2013.05.16 |

**02. පත් කිරීම් බලධරයා :** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : ප්‍රාථමික - ශිල්පීය

3.2 ශ්‍රේණි : III, II, I, විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : ආයතනයක් වෙත පැවරෙන කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාම සඳහා වන මූලික අවශ්‍යතාවයන් වන ඉදිකිරීම්, නඩත්තු, අළුත්වැඩියා, ආලෝකකරණය, ප්‍රවාහනය ඇතුළු මූලික කාර්යයන් අතුරින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි ( NVQ ) හතරවැනි මට්ටමේ කාර්මික පුහුණු සහතිකයක් / ප්‍රවීණතා සහතිකයක් මගින් තහවුරු කෙරෙන කාර්මික තැනැත්තන්ගෙන් සමන්විත නිලධර ගණයකි.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය :** ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත.

**05. වැටුප්**

5.1 වැටුප් කේත අංකය : PL – 3 – 2006 ( ඒ )

5.2 වැටුප් පරිමාණය : රු. 12,470-10X130-10X145-10X160-12X170-18,860/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය ( රු ) |
|---|---|---|
| III ශ්‍රේණිය | පියවර 01 | රු 12,470/- |
| II ශ්‍රේණිය | පියවර 12 | රු 13,915/- |
| I ශ්‍රේණිය | පියවර 22 | රු 15,380/- |
| විශේෂ ශ්‍රේණිය | පියවර 32 | රු 16,990/- |

**06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| වැද්දුම්කරු ( කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ) | III / II / I හා විශේෂ | 3 | 1. ආයතනයේ වැද්දුම් ක්ෂේත්‍රයේ නඩත්තු කටයුතු, කාර්මික විද්‍යාලවල ලෝහ වැඩ අංශයේ උපදේශකවරුන්ගේ අධීක්ෂණය යටතේ එම අංශයේ ප්‍රායෝගික පුහුණු කටයුතුවලට සහාය වීම.<br>2. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් රාජකාරි |
| වැද්දුම්කරු ( එම දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ විද්‍යාල ) | III / II / I හා විශේෂ | 9 | |
| වැද්දුම්කරු ( එම දෙපාර්තමේන්තුව යටතේ ඇති කාර්මික විද්‍යාල ) | III / II / I හා විශේෂ | 29 | |
| යන්ත්‍ර ශිල්පී ( කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ) | III / II / I හා විශේෂ | 14 | 1. තාක්ෂණ / කාර්මික විද්‍යාලවල ඇති වැඩහල්වල යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාව හා නඩත්තු කටයුතු කිරීම, ගොඩනැගිලි වෘත්තීය අංශයේ ප්‍රායෝගික පුහුණු කටයුතුවලට සහාය වීම.<br>2. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් රාජකාරි |
| විදුලි කාර්මික ( කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ) | III / II / I හා විශේෂ | 5 | 1. විදුලි පරිපථවල හා විද්‍යුත් යන්ත්‍රවල දෝෂයන් හඳුනාගැනීම හා ඒවා නිවැරදි කිරීම ආයතනයේ විදුලි උපකරණ අළුත්වැඩියාව හා ආයතනයේ විදුලි කම්බි ඇදීමේ කටයුතු<br>2. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් රාජකාරි |
| විදුලි කාර්මික ( එම දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ විද්‍යාල ) | III / II / I හා විශේෂ | 9 | |
| විදුලි කාර්මික ( එම දෙපාර්තමේන්තුව යටතේ ඇති කාර්මික විද්‍යාල ) | III / II / I හා විශේෂ | 29 | |
| පෙදරේරු ( කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ) | III / II / I හා විශේෂ | 1 | 1. ආයතනයේ පෙදරේරු ක්ෂේත්‍රයට අදාළ නඩත්තු කටයුතු කිරීම, ගොඩනැගිලි වෘත්තීය අංශයේ ප්‍රායෝගික පුහුණු කටයුතුවලට සහාය වීම.<br>2. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් රාජකාරි |
| පෙදරේරු ( එම දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ විද්‍යාල ) | III / II / I හා විශේෂ | 9 | |
| පෙදරේරු ( එම දෙපාර්තමේන්තුව යටතේ ඇති කාර්මික විද්‍යාල ) | III / II / I හා විශේෂ | 29 | |
| වඩු කාර්මික ( කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ) | III / II / I හා විශේෂ | 1 | 1. ආයතනයේ වඩු කාර්මික ක්ෂේත්‍රයේ නඩත්තු කටයුතු, කාර්මික විද්‍යාලවල ලී වැඩ අංශයේ උපදේශකවරුන්ගේ අධීක්ෂණය යටතේ එම අංශයේ ප්‍රායෝගික පුහුණු කටයුතුවලට සහාය වීම.<br>2. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් රාජකාරි |
| වඩු කාර්මික ( එම දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ විද්‍යාල ) | III / II / I හා විශේෂ | 9 | |
| වඩු කාර්මික ( එම දෙපාර්තමේන්තුව යටතේ ඇති කාර්මික විද්‍යාල ) | III / II / I හා විශේෂ | 29 | |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III, II, I හා විශේෂ ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

| | | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | තාක්ෂණ විද්‍යාල | කාර්මික විද්‍යාල |
|---|---|---|---|---|
| 1. | වැද්දුම්කරු | 3 | 9 | 29 |
| 2. | යන්ත්‍ර ශිල්පී | 14 | - | - |
| 3. | විදුලි කාර්මික | 5 | 9 | 29 |
| 4. | පෙදරේරු | 1 | 9 | 29 |
| 5. | වඩු කාර්මික | 1 | 9 | 29 |

**07. බඳවා ගැනීමේ ක්‍රමය**

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 80% |
| සීමිත | 20% |
| කුසලතා | නැත |

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙක ( 02 ) ක් සහිතව විෂයයන් හය ( 06 ) කින් සමත් වී තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවයන්හි ( NVQ ) 4 වැනි මට්ටමට නොඅඩු මට්ටමක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හෝ පහත පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

**7.2.2.2.1. වැද්දුම්කරු :**

I. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු ශිල්පය පිළිබඳ ජාතික සහතිකය ( වැද්දුම් යන්ත්‍ර ශිල්පී )

හෝ

II. කාර්මික විද්‍යාලයක වැද්දුම් වැඩ පිළිබඳ පූර්ණකාල පාඨමාලාවක් හදාරා ලත් සහතිකය

හෝ

III. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය / වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පිරිනැමෙන වැද්දුම්කරු 11 ශ්‍රේණියේ ජාතික වෘත්තීය සහතිකය ලබා තිබීම.

හෝ

IV. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක එක් අවුරුද්දකට නොඅඩු පූර්ණකාලීන වැද්දුම් කටයුතු පිළිබඳ පාඨමාලාවක් හදාරා සමත්වී තිබීම.

7.2.2.2.2. යන්ත්‍ර ශිල්පී :

I. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු ශිල්පය පිළිබඳ ජාතික සහතිකය ( යන්ත්‍ර ශිල්පී ) ලබා තිබීම,

හෝ

II. කාර්මික විද්‍යාලයක යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දෑඅවුරුදු පාඨමාලාවක් සමත්වී ලත් සහතිකය ලබා තිබීම,

හෝ

III. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක එක් අවුරුද්දකට නොඅඩු පූර්ණකාලීන යන්ත්‍ර ශිල්පය පිළිබඳ පාඨමාලාවක් හදාරා සමත්වී තිබීම.

**7.2.2.2.3. විදුලි කාර්මික :**

I. රජයේ කාර්මික විද්‍යාලයකින් නිකුත් කරන ලද දෑඅවුරුදු පූර්ණ කාල දිවා වෘත්තීය සහතිකය හෝ ඉංජිනේරු වෘත්තීය පිළිබඳ ජාතික සහතිකය ( විදුලි කාර්මික ).

හෝ

II. ජාතික ආධුනිකත්ව මණ්ඩලය ( ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය ) මගින් නිකුත් කරන ලද වසර තුනහමාරක ( 3 1/2 ) විදුලි ශිල්ප බලවේග සහතිකය හෝ විදුලි කම්බිකරු තුන් අවුරුදු සහතිකය,

හෝ

III. ජාතික වෘත්තීය පරීක්ෂණයේ විදුලි කාර්මික දෙවන ශ්‍රේණිය ( II ) සඳහා නිකුත් කරන ලද සහතිකය

හෝ

IV. වෙනත් සමාන හෝ උසස් සහතිකයක්

7.2.2.2.4. පෙදරේරු ශිල්පී :

I. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු ශිල්පය පිළිබඳ ජාතික සහතිකය ( පෙදරේරු ශිල්පී ) ලබා තිබීම,

හෝ

II. කාර්මික විද්‍යාලයක ගොඩනැගිලි වෘත්තීය පිළිබඳ දෑඅවුරුදු පාඨමාලාව සමත්වී ලත් සහතිකය ලබා තිබීම,

හෝ

III. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය ලබා තිබීම,

හෝ

IV. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය යටතේ පෙදරේරු ආධුනිකත්ව සහතිකය ලබා තිබීම,

හෝ

V. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පිරිනැමෙන පෙදරේරු 11 ශ්‍රේණියේ ජාතික වෘත්තීය සහතිකය,

හෝ

V. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක එක් අවුරුද්දකට නොඅඩු පූර්ණකාලීන පෙදරේරු පාඨමාලාවක් හදාරා සමත්වී තිබීම.

7.2.2.2.5. වඩු කාර්මික :

I. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු ශිල්පය පිළිබඳ ජාතික සහතිකය ( යාන්ත්‍රික ලී වැඩ ) ලබා තිබීම.

හෝ

II. කාර්මික විද්‍යාලයක වඩුවැඩ හා පිරිද්දුම් වැඩ පිළිබඳ දෑඅවුරුදු පාඨමාලාව සමත්වී ලත් සහතිකය ලබා තිබීම.

හෝ

III. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය ලබා තිබීම.

හෝ

IV. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය යටතේ වඩු කාර්මික ආධුනිකත්ව සහතිකය ලබා තිබීම.

හෝ

V. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පිරිනැමෙන වඩු කාර්මික 11 ශ්‍රේණියේ ජාතික වෘත්තීය සහතිකය.

හෝ

V. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක එක් අවුරුද්දකට නොඅඩු පූර්ණකාලීන වඩු කාර්මික පාඨමාලාවක් හදාරා සමත්වී තිබීම.

7.2.2.3 පළපුරුද්ද : අදාළ වෘත්තියේ රජයේ හෝ පිළිගත් ආයතනයක අවුරුදු 02 ක පළපුරුද්ද

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 හා 7.2.3 හි සඳහන් සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 45 ට නොවැඩි

රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් බඳවා ගනු ලැබේ. පළමුව වෘත්තීය පරීක්ෂණයක් පවත්වනු ලබන අතර වෘත්තීය පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව ඉහළම ලකුණු ලැබූවන්ගෙන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් හා වෘත්තීය පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.2.4.2. වෘත්තීය පරීක්ෂණය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| වෘත්තීය පරික්ෂණය | 100 | 40% |

වෘත්තීය පරික්ෂණයේ ආකෘතිය ඇමුණුම 01 හි දක්වා ඇත.

7.2.4.2.1. පවත්වන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 50 | |
| අතිරේක පළපුරුද්ද | 25 | |
| සම්මුඛ පරික්ෂණයේදී පෙන්වන කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

7.2.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.3 සීමිත බඳවා ගැනීම**

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස.( සා.පෙ. ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙක ( 02 ) ක් සහිතව විෂයයන් හය ( 06 ) කින් සමත්වී තිබීම.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවයන්හි ( NVQ ) 4 වැනි මට්ටමට නොඅඩු මට්ටමක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හෝ පහත පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම

**7.3.2.2.1. වෑද්දුම්කරු :**

I. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු ශිල්පය පිළිබඳ ජාතික සහතිකය ( වෑද්දුම් යන්ත්‍ර ශිල්පී )

හෝ

II. කාර්මික විද්‍යාලයක වැද්දුම් වැඩ පිළිබඳ පූර්ණකාල පාඨමාලාවක් හදාරා ලත් සහතිකය

හෝ

III. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය / වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පිරිනැමෙන වැද්දුම්කරු 11 ශ්‍රේණියේ ජාතික වෘත්තීය සහතිකය ලබා තිබීම.

හෝ

IV. රජයේ හෝ රජය පිළිගත් ආයතනයක එක් අවුරුද්දකට නොඅඩු පූර්ණකාලීන වැද්දුම් කටයුතු පිළිබඳ පාඨමාලාවක් හදාරා සමත්වී තිබීම.

**7.3.2.2.2. යන්ත්‍ර ශිල්පී :**

I. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු ශිල්පය පිළිබඳ ජාතික සහතිකය ( යන්ත්‍ර ශිල්පී ) ලබා තිබීම.

හෝ

II. කාර්මික විද්‍යාලයක යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැඅවුරුදු පාඨමාලාවක් සමත්වී ලත් සහතිකය ලබා තිබීම.

හෝ

III. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක එක් අවුරුද්දකට නොඅඩු පූර්ණකාලීන යන්ත්‍ර ශිල්පය පිළිබඳ පාඨමාලාවක් හදාරා සමත්වී තිබීම.

**7.3.2.2.3. විදුලි කාර්මික :**

I. රජයේ කාර්මික විද්‍යාලයකින් නිකුත් කරන ලද දැඅවුරුදු පූර්ණ කාල දිවා වෘත්තීය සහතිකය හෝ ඉංජිනේරු වෘත්තීය පිළිබඳ ජාතික සහතිකය ( විදුලි කාර්මික ).

හෝ

II. ජාතික ආධුනිකත්ව මණ්ඩලය ( ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය ) මගින් නිකුත් කරන ලද වසර තුනහමාරක ( 3 1/2 ) විදුලි ශිල්ප බලවේග සහතිකය හෝ විදුලි කම්බිකරු තුන් අවුරුදු සහතිකය.

හෝ

III. ජාතික වෘත්තීය පරීක්ෂණයේ විදුලි කාර්මික දෙවන ශ්‍රේණියේ ( II ) සඳහා නිකුත් කරන ලද සහතිකය

හෝ

IV. වෙනත් සමාන හෝ උසස් සහතිකයක්

**7.3.2.2.4. පෙදරේරු :**

I. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු ශිල්පය පිළිබඳ ජාතික සහතිකය ( පෙදරේරු ශිල්පී ) ලබා තිබීම.

හෝ

II. කාර්මික විද්‍යාලයක ගොඩනැගිලි වෘත්තීය පිළිබඳ දැඅවුරුදු පාඨමාලාව සමත්වී ලත් සහතිකය ලබා තිබීම.

හෝ

III. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය ලබා තිබීම.

හෝ

IV. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය යටතේ පෙදරේරු ආධුනිකත්ව සහතිකය ලබා තිබීම,

හෝ

V. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පිරිනැමෙන පෙදරේරු 11 ශ්‍රේණියේ ජාතික වෘත්තීය සහතිකය,

හෝ

VI. රජයේ හෝ රජය පිළිගත් ආයතනයක එක් අවුරුද්දකට නොඅඩු පූර්ණකාලීන පෙදරේරු පාඨමාලාවක් හදාරා සමත්වී තිබීම.

**7.3.2.2.5. වඩු කාර්මික :**

I. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු ශිල්පය පිළිබඳ ජාතික සහතිකය ( යාන්ත්‍රික ලී වැඩ ) ලබා තිබීම,

හෝ

II. කාර්මික විද්‍යාලයක වඩුවැඩ හා පිරිද්දුම් වැඩ පිළිබඳ දැඅවුරුදු පාඨමාලාව සමත්වී ලත් සහතිකය ලබා තිබීම,

හෝ

III. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය ලබා තිබීම,

හෝ

IV. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය යටතේ වඩු කාර්මික ආධුනිකත්ව සහතිකය ලබා තිබීම,

හෝ

V. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පිරිනැමෙන වඩු කාර්මික 11 ශ්‍රේණියේ ජාතික වෘත්තීය සහතිකය,

හෝ

VI. රජයේ හෝ රජය පිළිගත් ආයතනයක එක් අවුරුද්දකට නොඅඩු පූර්ණකාලීන වඩු කාර්මික පාඨමාලාවක් හදාරා සමත්වී තිබීම.

7.3.2.3 පළපුරුද්ද : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන හා ප්‍රාථමික අර්ධ ශිල්පීය දෙපාර්තමේන්තුගත ස්ථිර තනතුරක වසර පහ ( 05 ),ක පළපුරුද්දක් ලබා තිබීම.

7.3.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :

I. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.3.2 හා 7.3.3 හි සඳහන් සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස :

7.3.3.1 අවම සීමාව : අදාළ නොවේ.

7.3.3.2 උපරිම සීමාව : අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් බඳවා ගනු ලැබේ. පළමුව වෘත්තීය පරීක්ෂණයක් පවත්වනු ලබන අතර වෘත්තීය පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව ඉහළම ලකුණු ලැබුවන්ගෙන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් හා වෘත්තීය පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| වෘත්තීය පරීක්ෂණය | 100 | 40 % |

( වෘත්තීය පරීක්ෂණය පිළිබඳ ආකෘතිය ඇමුණුම 01 මගින් දැක්වේ )

7.3.4.2.1 පවත්වන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 50 | |
| අතිරේක පළපුරුද්ද | 25 | |
| සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වන කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

7.3.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.4** කුසලතාව මත බඳවා ගැනීම – අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය /සහතික පාඨමාලාව / වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට පත්වී වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයක් මගින් ( ඇමුණුම 02 ) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස්වී වසර 03 ක් ගතවීමට පෙර | නිපුණතාවය පිළිබඳ වාචික පරීක්ෂණයක් මගින් ( ඇමුණුම 03 ) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස්වී වසර 05 ක් ගතවීමට පෙර | නිපුණතාවය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් ( ඇමුණුම 04 ) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

1 වන කාර්යක්ෂමතා කඩඉම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ආයතනයක් විසින්

2 වන කාර්යක්ෂමතා කඩඉම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

3 වන කාර්යක්ෂමතා කඩඉම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

**09. භාෂා ප්‍රවීණතාව :**

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් නියමිත භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

**10. ශ්‍රේණි උසස් කිරීම**

**10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම**

10.1.1 සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව :

10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය ( 10 ) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය ( 10 ) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය ( 10 ) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ ( 05 ) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

10.1.2 සුවිශේෂී කාර්ය සාධනය අනුව :

10.1.2.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවා ගණයේ III ශ්‍රේණියේ වසර හය ( 06 ) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06) ම නියමිත දිනට උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර හය ( 06 ) තුළ සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස්කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ ( 05 ) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළ ලබා තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්වී තිබීම.

10.1.2.2 උසස් කිරීමේ ක්‍රමය : ඉහත සුදුසුකම් සපුරාලන නිලධරයන්ට පත්කිරීම් බලධරයා අනුමත කරන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය හැකිය. ඉන් සමත්වන්නන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූවිට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. අදාළ සෙසු අවශ්‍යතාවන්ද සම්පූර්ණ කර ඇති නිලධරයන් පත්වීමේ දින සිට වසර හය (06) ක් සම්පූර්ණ වන දිනට ක්‍රියාත්මක වන පරිදි 11 ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධාරයා විසින් සිදුකරනු ලැබේ. ( අභියෝගතා පරීක්ෂණ විභාග ආකෘතිය ඇමුණුම් 05 හි ඇතුළත් වේ. )

**සටහන :**

I. සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් ලබාදීමේ දී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 60 % ක් ලබාගත යුතුය. තවද සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණය වර්ෂයකට එක් වරක් පවත්වනු ලබන අතර නිලධරයෙකුට පෙනී සිටිය හැක්කේ එක් වතාවක් පමණි.

II. නිලධරයකුට පාලනය කළ නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස්කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හිදී පසුව පැවැත්වෙන අභියෝගිතා පරීක්ෂණයට එම නිලධරයාට පෙනී සිටිය හැක. එවැනි නිලධරයකු සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස්කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය සමත් වූ දිනය වේ.

## 10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව :

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය ( 09 ) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය ( 09 ) ම උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ ( 05 ) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර නවය ( 09 ) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

10.2.2 සුවිශේෂී කාර්ය සාධනය අනුව :

10.2.2.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ II ශ්‍රේණියේ වසර අට ( 08 ) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක අට ( 08 ) ම නියමිත දිනට උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ ( 05 ) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර අට ( 08 ) තුළම සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්වී තිබීම.

10.2.2.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් සඳහා පත්කිරීම් බලධරයා විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් 50% ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගන්නා නිලධරයන් II ශ්‍රේණියට උසස්වී වසර අට ( 08 ) ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ. ( ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ආකෘතිය ඇමුණුම 06 හි ඇතුළත් වේ )

සංලක්ෂය :

1. සුවිශේෂී කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් රජය විසින් හඳුන්වා දී ක්‍රියාත්මක කරන තෙක් දැනට ක්‍රියාත්මක වන වාර්ෂික කාර්ය සාධන ඇගයීමේදී සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කරනු ලැබ ඇති තැනැත්තන්ට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් සඳහා වන ලිඛිත අභියෝගාත්මක පරීක්ෂණය / ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.
2. සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

**10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම**

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නමය ( 09 ) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවයක් ( 09 ) ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ ( 05 ) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර නවය ( 09 ) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම

10.3.1.2 **උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.**

11. තනතුරුවලට පත් කිරීම – අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ : "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූති නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. සේවයේ යෙදී සිටින නිලධාරීන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කරන ක්‍රමවේදය ඇමුණුම 07 මගින් දැක්වේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ : අත්සන : ..........................

( විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා )

නම : ..........................

තනතුර : ..........................

දිනය : 2013.06.14

පරීක්ෂා කළේ : අත්සන : ..........................

( විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා )

නම : ..........................

තනතුර : බී. පී. සී. කුලරත්න

දිනය : 2013/06/17

D:\OFFICE DOCUMENT\FR 71\Final\PL - 3 - 2006.doc

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................

( දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම : ..............................

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන)

තනතුර : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
තැ.පෙ. 557, ඕල්කට් මාවත, කොළඹ 10

දිනය : 2013.06.18

නිල මුද්‍රාව: ..............................

---

යොමු අංකය : 2/1/17/2/13

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................

නම : ..............................

( ලේකම් )

ඩබ්ලිව්.ඒ. ජයවික්‍රම
~~අතිරේක ලේකම් (පරිපාලන හා මුදල)~~ අමාත්‍යාංශය
යෞවන කටයුතු හා
නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය
"නිපුණතා පියස",
354/2, ඇල්විටිගල මාවත, කොළඹ - 05.

දිනය : 2013-06 26

---

යොමු අංකය : PSC/EST/8/1/44/1/4/2013

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2013.05.16 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..............................

නම : ..............................

( ලේකම් )

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2013 07 09

නිල මුද්‍රාව : ජේ.එම්.එල්.සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

ඇමුණුම 01

1. පරීක්ෂණයේ නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ වෘත්තීය පරීක්ෂණය

2. පරීක්ෂණය පිළිබඳ විස්තර :

| පරීක්ෂණයේ නම | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| වෘත්තීය පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

3. පවත්වනු ලබන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය අනුව

5. වෘත්තීය පරීක්ෂණය සඳහා වන විෂය නිරදේශය :

| පරීක්ෂණයේ නම | තනතුර | විෂය නිරදේශය |
|---|---|---|
| වෘත්තීය පරීක්ෂණය | වෑද්දුම්කරු | 1. සැලසුම් කියවා තේරුම් ගැනීමේ හැකියාව<br>2. කාර්යයන් සඳහා සුදුසු ද්‍රව්‍ය හඳුනාගැනීම<br>3. ලෝහ කාර්මික ක්ෂේත්‍රයේ යන්ත්‍ර හා උපකරණ පරිහරණය කිරීමේ හැකියාව |
| | යන්ත්‍ර ශිල්පී | 1. තනතුරට අදාළව මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ තාක්ෂණ දැනුම<br>2. යන්ත්‍රවල ඇතිවන දෝෂයන් හඳුනා ගැනීම.<br>3. අළුත්වැඩියාවන් සඳහා ඇස්තමේන්තු සකස් කිරීම. |
| | විදුලි කාර්මික | 1. විදුලි පිහිටවුමක් සැකසීම<br>2. විදුලි මිනුම් උපකරණ හා ඒවායේ භාවිතය පිළිබඳ අවබෝධය<br>3. විදුලි පිහිටවුමක දෝෂ හඳුනාගැනීම හා නඩත්තු කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම |
| | පෙදරේරු | 1. ඉදිකිරීම් කාර්මාන්තයේ භාවිත වන බදාම, කොන්ක්‍රීට් මිශ්‍රණ, පිළිබඳ දැනුම.<br>2. පෙදරේරු වෘත්තියේ භාවිත වන උපකරණ පිළිබඳ දැනුම.<br>3. සැලසුම් සඳහා ඇස්තමේන්තු සැකසීම |
| | වඩුකාර්මික | 1. සැලසුම් හා සරළ ඇඳීම් තේරුම් ගැනීම<br>2. කාර්යයට සුදුසු දැව හඳුනා ගැනීම ඉදිකිරීම් අංශය හා ගෘහ භාණ්ඩ කටයුතු පිළිබඳ අවබෝධය<br>3. මූලික අත්ආයුධ හඳුනාගැනීම හා පරිහරණය පිළිබඳ අවබෝධය |

සකස් කළේ :

අත්සන :

නම :

තනතුර :

දිනය : 2013. 06. 14

පරීක්ෂා කළේ :

අත්සන : ඩී. ජ. සී. කුලරත්න

නම :

තනතුර : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

දිනය : 2013/06/17

අත්සන :

( දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම :

තනතුර : ජේ. ක්‍රිෂ්ණමූර්ති
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන)

දිනය : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

නිල මුද්‍රාව: තැ.පෙ. 557, ඕල්කට් මාවත, කොළඹ 10

2013. 06. 18

1. පරීක්ෂණයේ නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහය හා පරිපාටික රීති | පැය 02 | 100 | 40 % |
| 2. මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

5. පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. ආයතන සංග්‍රහය හා පරිපාටික රීති | ආයතන සංග්‍රහයේ XII, XIII, XIV, XXIV, XXVII, XXXI, XXXII යන පරිච්ඡේද හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති |
| 2. මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි I, V, XII, XIII පරිච්ඡේද |

සකස් කළේ :

අත්සන : ..................

නම : ..................

තනතුර : ..................

දිනය : 2013.06.14

පරීක්ෂා කළේ :

අත්සන : ..................

නම : ..................

තනතුර : ..................

දිනය : 2013/06/17

අත්සන : ..................

( දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම : ජේ. ක්‍රිෂ්ණමූර්ති

තනතුර : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන)
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
තැ.පෙ. 557, ඕල්කට් මාවත, කොළඹ 10

දිනය : 2013.06.18

නිල මුද්‍රාව: ..................

1. පරීක්ෂණයේ නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
2. පරීක්ෂණය පිළිබඳ විස්තර :

| පරීක්ෂණයේ නම | ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| නිපුණතාවය පිළිබඳ වාචික පරීක්ෂණය | 1. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ භාවිතා කෙරෙන යන්ත්‍රයක / උපකරණයක / වැඩබිමක රූපසටහනක කොටස් නම් කිරීම – ලකුණු 05 බැගින් උපරිම ලකුණු 25<br>2. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ භාවිතා කෙරෙන පාරිභාෂික වචන පැහැදිලි කිරීම – ලකුණු 05 බැගින් උපරිම ලකුණු 25<br>3. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ භාවිතා කෙරෙන යන්ත්‍ර / උපකරණ නම් කිරීම – ලකුණු 05 බැගින් උපරිම ලකුණු 25<br>4. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ සිදු කෙරෙන කටයුත්තක් අතීතයේ දී සිදු කළ ආකාරය වර්තමානයේදී වෙනස්වී ඇති අයුරු පැහැදිලි කිරීම – ලකුණු 05 බැගින් උපරිම ලකුණු 25 | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්
4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්
5. පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

| පරීක්ෂණයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| නිපුණතාවය පිළිබඳ වාචික පරීක්ෂණය | තනතුරට අදාළ ක්ෂේත්‍රයේ භාවිතා කෙරෙන යන්ත්‍රයක / උපකරණයක / වැඩබිමක රූපසටහන්, තනතුරට අදාළ ක්ෂේත්‍රයේ භාවිතා කෙරෙන පාරිභාෂික වචන, තනතුරට අදාළ ක්ෂේත්‍රයේ භාවිතා කෙරෙන යන්ත්‍ර / උපකරණ, තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ක්‍රියාකාරම්වල පැරණි හා නූතන භාවිතය |

සකස් කළේ :
අත්සන : ........................
නම : ........................
තනතුර : ........................
දිනය : 2013.06.14

පරීක්ෂා කළේ :
අත්සන : ........................
නම : බී. පී. සී. ...රත්න
අධ්‍යක්ෂ (පරීක්ෂණ)
තනතුර : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
ඕල්කට් මාවත, කොළඹ - 10.
දිනය : 2013/06/17

අත්සන : ........................
( දෙපාර්තමේන්තු ප්‍රධාන )
නම : ජේ. කිෂ්ණමූර්ති
තනතුර : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන)
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
දිනය : තැ.පෙ. 557, ඕල්කට් මාවත, කොළඹ 10
නිල මුද්‍රාව: 2013.06.18

1. පරීක්ෂණයේ නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. පරීක්ෂණය පිළිබඳ විස්තර :

| පරීක්ෂණයේ නම | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතාවය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්.

5. පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

| පරීක්ෂණයේ නම | තනතුර | විෂය නිර්දේශය |
|---|---|---|
| නිපුණතාවය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | වෑද්දුම්කරු | 1. ලෝහ කර්මාන්තයේ භාවිතාවන ද්‍රව්‍ය හා ඒවා භාවිතය<br>2. වෑද්දුම් ශිල්පය සඳහා භාවිතාකරන ආයුධ / උපකරණ<br>3. ලෝහ කර්මාන්තයේ භාවිතා වන යන්ත්‍රසූත්‍ර පිළිබඳ දැනුම<br>4. ලෝහ පෑස්සුම් ශිල්පය හා එකලස් කිරීම<br>5. ඇස්තමේන්තු සැකසීම |
| | යන්ත්‍ර ශිල්පී | 1. තනතුරට අදාළව මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ තාක්ෂණ දැනුම<br>2. යන්ත්‍රවල ඇතිවන දෝෂයන් හඳුනා ගැනීම.<br>3. ආයුධ, මෙවලම් පිළිබඳ දැනුම<br>4. අළුත්වැඩියාවන් සඳහා ඇස්තමේන්තු සකස් කිරීම. |
| | විදුලි කාර්මික | 1. මයික්‍රෝ මීටරය භාවිතය<br>2. විදුලි මිනුම් උපකරණ හඳුනාගැනීම හා භාවිතය<br>3. විදුලි පිහිටුවමක් සම්බන්ධයෙන් වන මූලික IEE රෙගුලාසි පිළිබඳ අවබෝධය<br>4. විදුලි යොත්වල ප්‍රමාණයන් හා ඒවායේ ගෙනයා හැකි විදුලි ධාරාවන් පිළිබඳ දැනුම<br>5. විදුලි පිහිටුමක හා එදිනෙදා පාවිච්චි කරන විදුලි උපකරණවල පරිවරණ ප්‍රතිරෝධ පරීක්ෂාව<br>6. විදුලි ගිනි හා එවැනි ගින්නක් නිවීමේ හැකියාව පරීක්ෂාව |
| | පෙදරේරු | 1. බදාම, කොන්ක්‍රීට් පිළිබඳ දැනුම.<br>2. ගඩොල් එළීම පිළිබඳ දැනුම.<br>3. කපරාදු කිරීම පිළිබඳ දැනුම.<br>4. සැලසුමකට අනුව කටයුතු සංවිධානය කිරීමේ හැකියාව.<br>5. උපකරණ භාවිතය පිළිබඳ දැනුම. |

| පරීක්ෂණයේ නම | තනතුර | විෂය නිර්දේශය |
|---|---|---|
| නිපුණතාවය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | වඩුකාර්මික | 1. ඇස්තමේන්තු පිළියෙල කිරීම<br>2. අදාළ කාර්යයන්ට සුදුසු දැව හඳුනා ගැනීම<br>3. ආයුධ, මෙවලම් හා යන්ත්‍රසූත්‍ර පිළිබඳ දැනුම<br>4. සරනේරු, දොරඅගුළු යතුරු තහඩු හා සොයිබ වැනි උපාංග සවි කිරීමේ දැනුම<br>5. ඉදිකිරීම් අංශය, ගෘහ භාණ්ඩ හා කැබිනෙට්ටු කටයුතුවලට අදාළ ලී වැඩ |

**සකස් කළේ :**

අත්සන : ..............................

නම : ..............................

තනතුර : ..............................

දිනය : 2013.06.14

**පරීක්ෂා කළේ :**

අත්සන : ..............................

නම : බී. ඒ. සී. කලුරත්න

තනතුර : [illegible] කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ඕල්කට් මාවත, කොළඹ - 10.

දිනය : 2013/06/17

අත්සන : ..............................

( දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම : ජේ. ක්‍රිෂ්ණමූර්ති

තනතුර : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

දිනය : තැ.පෙ. 557, ඕල්කට් මාවත, කොළඹ 10

නිල මුද්‍රාව: 2013.06.18

1. විභාගයේ නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරුවලට අදාළ සුවිශේෂී කාර්ය සාධනය යටතේ III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 60% |

3. පවත්වනු ලබන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවස්ථානුකූලව

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්ය සාධන මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම කුසලතා හා ආකල්ප අත්පත් කර ගෙන තිබේද යන්න හා ඒවා භාවිතයේදී ඉහළ ප්‍රවීණතාවයක් දක්වන්නේද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. |

සකස් කළේ :

අත්සන : ..........

නම : ..........

තනතුර : .......... - 10.

දිනය : 2013 . 06 . 14

පරීක්ෂා කළේ :

අත්සන : ..........

නම : බී. ජී. සී. කුලරත්න

තනතුර : අධ්‍යක්ෂ (පරිපාලන) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ඕල්කට් මාවත, කොළඹ - 10.

දිනය : 2013 / 06 / 17

අත්සන : ..........

( දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම : ජේ. ක්‍රිෂ්ණමූර්ති

තනතුර : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපා...

දිනය : තැ.පෙ. 557, ඕල්කට් මාවත, කොළඹ 10

නිල මුද්‍රාව: 2013 . 06 . 18

ඇමුණුම 06

1. පරීක්ෂණයේ නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරුවලට අදාළ සුවිශේෂී කාර්ය සාධනය යටතේ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

2. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණය :

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. රාජකාරී කටයුතුවලදී ආයතනයට දක්වන ලද විශේෂ දායකත්වයන්<br>( එක් දායකත්වයක් සඳහා ලකුණු 05 බැගින් ) | 50 | 50% |
| 2. කාර්ය සාධනය ඇගයීම<br>( උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 සඳහා )<br>ඉතා හොඳයි - ලකුණු 09<br>හොඳයි - ලකුණු 06<br>සතුටුදායකයි - ලකුණු 03 | 45 | |
| 3. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය සඳහා | 05 | |
| එකතුව | 100 | |

3. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය කොපමණ කාල සීමාවකට වරක්ද යනවග : අවස්ථානුකූලව

සකස් කලේ :

අත්සන :

නම :

තනතුර :

දිනය : 2013.06.14

පරීක්ෂා කලේ :

අත්සන :

නම :

තනතුර : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ඕල්කට් මාවත, කොළඹ - 10.

දිනය : 2013/06/17

අත්සන :

( දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම :

තනතුර :

දිනය : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව තැ.පෙ. 557, ඕල්කට් මාවත, කොළඹ 10

නිල මුද්‍රාව: 2013.06.18

**සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කිරීම ( නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ )**

නව බඳවා ගැනීම් පටිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (IV) මගින් ලබාදී ඇති PL – 3 - 2006 ( ඒ ) වැටුප් ප්‍රමාණය යටතේ වැටුප් ලබන මෙම බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සේවකයන් සියලුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ වැටුප පරිවර්තනය කිරීමේ විධිවිධානයන්ට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ එම ශ්‍රේණියට පත්කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයේ වෙනස් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන්වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපිවීම මත ඊළඟ ඉහල වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

(i) **PL – 3 - III ශ්‍රේණිය**

(අ) PL – 3 - 2006 ( ඒ ) වැටුප් වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්.

(ආ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

**PL – 3 - III** ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

(ii) **PL – 3 - II ශ්‍රේණිය**

(අ) PL – 3 - 2006 ( ඒ ) වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත්පිරිසෙයින් අවුරුදු 10 ක හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 20 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීම් පටිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ආ) PL – 3 - 2006 ( ඒ ) වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්.

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 09 සම්පූර්ණ වුවද නව බඳවා ගැනීම් පටිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව I හෝ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

**PL – 3 - II** ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

(iii) **PL – 3 - I ශ්‍රේණිය**

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත්පිරිසෙයින් අවුරුදු 20 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 30 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ



91

කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක විස්ස ( 20 ) ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීම් පටිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්,

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත්පිරිසෙයින් අවුරුදු 09 ක් හා ඊට වැඩි එහෙත් අවුරුදු 19 කට අඩු සේවා කාලයක් ඇති, එමෙන්ම අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක නවය ( 09 ) ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්,

(ඇ) PL – 3 - 2006 ( ඒ ) වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්.

(ඈ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 09 සම්පූර්ණ වුවද විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

PL – 3 - I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

**(iv) PL – 3 විශේෂ ශ්‍රේණිය**

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත්පිරිසෙයින් අවුරුදු 30 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක තිහ ( 30 ) ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීම් පටිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත්පිරිසෙයින් අවුරුදු 19 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක දහනවය ( 19 ) ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ඇ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත්පිරිසෙයින් වසර 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ඈ) PL – 3 - 2006 ( ඒ ) වැටුප් පරිමාණයෙහි විශේෂ ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටතේ වැටුප් ලබන සේවකයින්

**PL – 3 විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.**

සකස් කළේ : අත්සන ..................

පරීක්ෂා කළේ : අත්සන ..................

නම : ..................

තනතුර : ..................

දිනය : 2013.06.14

නම : බී. පී. සී. කුලරත්න

තනතුර : අධ්‍යක්ෂ (පරිපාලන) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ඕල්කට් මාවත, කොළඹ - 10.

දිනය : 2013/06/17

( දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම : ජේ. ශ්‍රීකන්තමූර්ති

තනතුර : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව තැ.පෙ. 557, ඕල්කට් මාවත, කො...

දිනය : 2013.06.18

නිල මුද්‍රාව